ඛ12/13/ධි/ධි/එල්/06,

06 .12.2011

දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක : **24/2011**

සියළුම භාණ්ඩලික නිලධාරීන්,
සියළුම බන්ධනාගාර අධිකාරීවරුන්,
සහකාර අධිකාරීවරුන් වෙත,

# <u>2011 වර්ෂය සඳහා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සිරකරු සුබසාධක අරමුදලේ අවසාන ගිණුම් ඉදිරිපත් කිරීම.</u>

මහා භාණ්ඩාගාරයේ චක්‍රලේඛ අංක 01/2004 හා 2004.02.24 දිනැති චක්‍රලේඛය පරිදි සිරකරු සුබ සාධක අරමුදල් ගිණුමේ 2011 වර්ෂයට අදාල අවසාන ගිණුම් වාර්තාව 2011/02.28 දිනට පෙර සකස් කර අවසන්කල යුතුව ඇත. එබැවින් ඔබ ආයතනය මගින් මූලස්ථානය වෙත එවිය යුතු 2011 වර්ෂය වෙනුවෙන් පිළියෙල කල යුතු අරමුදලේ අවසාන ගිණුම් වාර්තාව මේ සමග ඉදිරිපත් කර ඇති ගිණුම් වාර්තා ආකෘතිය අනුකූලව නිවැරදිව පිළියෙල කර, 2011/01/15 දිනට පෙර මා වෙත එවීමට කටයුතු කරනලෙස මෙයින් දන්වමි. තවද 2011 නොවැම්බර් 30 වැනි දිනට පෙර කාලයට අදාල මාසික ගිණුම් වාර්තා (මුල් මාස 11) 2011/12.20 දිනට පෙර මූලස්ථානයේ ගිණුම් අංශය වෙත ලැබී තිබිය යුතුය.

02. එම ගිණුම් වාර්තා සැකසීමේදී 2011 ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා මාසික ගිණුම් වාර්තාගත මගින් මූලස්ථානය වෙත රිපෝර්තු කරන ලද සිරකරු සුබසාධක අරමුදලේ ලැබීම් හා ගෙවීම් වලට සැසඳෙන ලෙසට අරමුදල් සහන ගෙවීම් වාර්තාව (ඩී ආකෘතිය) හා සහන ලැබීම් වාර්තාව (ඒ ආකෘතිය) අනුව පිළියෙල කල යුතු අතර, 2011 වර්ෂයට උපචිත ලැබීම් ඇත්නම් හිඟහිට ලැබීම් වාර්තාව (බී ආකෘතිය) මගින් ඉදිරිපත් කල යුතුය.

03. ඉහත අංක 01 හි සඳහන් වාර්තාව අනුව 2011 වසරේ මුල් මාස 11ට අදාල සියළුම ගිණුම් ලේඛන 2011/12/21 දිනට පෙර බන්ධනාගාර කොමසාරිස් (මුදල්) විසින් නිවැරදි කර තිබිය යුතුය. බන්ධනාගාර ආයතන සඳහා අරමුදලට ලැබෙන පරිත්‍යාග හා ආධාර සඳහා ලැබූ සියළුම වත්කම් නිවැරදි ලෙසට ගිණුම් ගත කිරීම් කර නොමැති බවත්, එම පරිත්‍යාග හා ආධාර සියළුම වත්කම් නිවැරදි ලෙසට ගිණුම් ගත කිරීම් කර නොමැති බවත්,

එම පරිත්‍යාග වත්කම් වාර්ෂික ගබඩා සමීක්ෂණ කටයුතු සඳහා ඉදිරිපත් කර නොමැති බවත්, විගණකාධිපතිගේ විගණන විමසුම් වාර්තා මගින් පෙන්වා දී ඇත. එබැවින් 2011වර්ෂය සඳහා අරමුදලට ලැබී ඇති පරිත්‍යාග හා ආධාර ලැබීම් (ඒ ආකෘතිය) මගින්ද, 2011 වර්ෂයේ මිලදී ගනු ලබන සියළුම ස්ථාවර වත්කම් (ඩී ආකෘතිය) මගින්ද, නිවැරදිව හා පැහැදිලිව සඳහන් කර ඉදිරිපත් කළ යුතුය. තවද, 2011 මුල් මාස 11 තුළ පරිත්‍යාග වශයෙන් ලැබූ සියළුම භාණ්ඩ පිළිබඳව විස්තර (ලැබූ දිනය, ලැබූ ආයතනය, ඒ සඳහා බන්ධනාගාර කොමසාරිස් ජනරාල්ගේ අනුමැතිය ලබා ගෙන තිබේද එසේ නම් එම දිනය, එහි වටිනාකම හා එය ප්‍රයෝජනය සඳහා යොදාගෙන ඇත්ද? නැද්ද? ඇත්නම් ප්‍රයෝජනයට ගැනීම ආරම්භ කළ දිනය නැත්නම් එයට හේතු යනාදිය සමඟ) වාර්තාවක් බන්ධනාගාර කොමසාරිස් (මුදල්) වෙත 2011/12/20 දිනට පෙර ඉදිරිපත් කළ යුතු අතර, 2012 වර්ෂයේ ජනවාරි මස සිට ඔබ ආයතනවලට ලැබෙන සියළුම පරිත්‍යාග වත්කම් පිළිබඳව වාර්තාවක් මාසිකව බන්ධනාගාර කොමසාරිස්(මුදල්) වෙත ඉදිරිපත් කළ යුතුය. 2011 වර්ෂයතුළ ඔබ ආයතනය විසින් ලබාදෙන ලද ත්‍යාග පිළිබඳ වාර්තාවක්ද (F ආකෘතිය) මගින් ඉදිරිපත් කරන්න. (දිනය, ත්‍යාග ලාභී සිරකරුගේ නම, ත්‍යාග ලබාදෙන ලද කාරණාව, ත්‍යාග විස්තර වටිනාකම)

04. තවද, මෙම අරමුදලේ ගිණුම් සැකසීම පිළිබඳව උපදෙස් බන්ධනාගාර කොමසාරිස් ජනරාල්ගේ අංක සී/ඩී/ඇල්/32-559 හා 1987/03/20, අංක සී/ඩී/ඇල්/14/12-87 හා 1987/03/20 බ/12/09/සී/ඩී/ඇල්/6-13-2005 හා 2005/08/26, බ12/10/සී/ඩී/ඇල්/06 -15/2005 හා 2005/10/06 සහ බ12/08/00/1/2 හා 2006/01/20 දිනැති චක්‍රලේඛයෙන් හා ඉහත සඳහන් කරුණු කෙමෙර් ඔබගේ විශේෂ අවධානය යොමුකර 2011 වර්ෂයට අදාළව අරමුදලේ අවසාන ගිණුම් වාර්තාව පිළියෙල කර නියමිත දිනට පෙර ඉදිරිපත් කරන ලෙසට මෙයින් උපදෙස් දෙමි.

විගණකාධිපති හා අභ්‍යන්තර විගණන අංශය විසින් පෙන්වා දී ඇති විගණන නිරීක්ෂණ සම්බන්ධයෙන් අදාළ සියලුම නිලධාරීන් දැනුවත් කිරීමට සහ ඒ අනුව ඉදිරි කටයුතු කිරීමට බන්ධනාගාර කොමසාරිස් (මුදල්) විධින උපදෙස් ලබාදීම සිදුකළ යුතු වේ.

..................................

පී.ඩබ්ලිව් කොඩිප්පිලි.

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්.

පිටපත - 01. ලේකම්, පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය, - අවශ්‍ය කටයුතු සඳහා

02. බන්ධනාගාර කොමසාරිස්(සුබසාධන) - අවශ්‍ය කටයුතු සඳහා

03. නියෝජ්‍ය කොමසාරිස්(අභ්‍යන්තර විගණන) - මෙම කටයුතු අධීක්ෂණය සඳහා